# පෝක් සමුද්‍ර සන්ධිය අවට කලාපයේ ධීවර ගැටලු විසඳන නීති රීති සැකසීම


අන්තර්ක්‍රියාකාරී සැලසුම් සම්පාදක මණ්ඩපයක කාර්යභාරය

## (ප්‍රතිපත්ති සන්නිවේශනයකි)

ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන මිත්‍ර රටවල් දෙක අතර දේශපාලන අර්බුද මතු කරවන සාධකයක් බවට පෝක් සමුද්‍ර සන්ධිය අවට කලාපය දැන් පත් වී තිබේ. ඈත අතීතයේ පටන් ම මේ දෙරටෙහි ධීවරයන් විසින් භුක්ති විඳි මෙම ප්‍රදේශය ජාත්‍යන්තර මුහුදු සීමා රේඛාවකින් වෙන් කරනු ලැබ ඇත. මත්ස්‍ය සම්පත් කෙරෙහි ලොල් වීම හේතු කොටගෙන ඉන්දීය ධීවරයෝ දැඩි උත්සායක යෙදෙමින් ශ්‍රී ලාංකීය මුහුදු සීමාවට ද ඇතුළු වෙති. මුහුදු සීමාවන් වෙන් කරගැනීමෙන් අනතුරුව උතුරු ශ්‍රී ලංකාවෙහි ධීවරයන් ගේ කර්මාන්තය යළි ආරම්භ වනවාත් සමඟ ම තමනට හිමි මුහුදු සීමාවෙහි මත්ස්‍ය සම්පත් ඉන්දීය ධීවර යාත්‍රාවන් විසින් ඩැහැගනු ලැබීමේ පමණක් නොව ස්වකීය ආම්පන්න පවා විනාශ කරනු ලැබීමේ ගැටලුවට මුහුණ දෙන්නට ලාංකීය ධිවරයනට සිදු වී තිබේ. මුහුදු සීමා නීති උල්ලංඝනය කිරීමේ වරදට නිතර නිතර අත් අඩංගුවට ගැනෙන ධීවරයන් දිගු කලක් රඳවාගනු ලැබීම නිසා ධීවරයෝ පමණක් නොව ඔවුන් ගේ පවුල් ද හිරිහැරයට පත් වෙති. දෙරටෙහි ආණ්ඩු අතර මෙන් ම ධීවර සංවිධානයන් අතර ද පැවැති සාකච්ඡාවන් තුළින් කිසිදු ප්‍රතිඵලයක් අත් වී නැත. **පෝක් සමුද්‍ර සන්ධි ප්‍රදේශයේ ධීවර ගැටුම් සඳහා ඵලදායී විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වනු පිණිස අන්තර්ක්‍රියාකාරී ඒකාබද්ධ සැලසුම් සම්පාදක මණ්ඩපයක් ස්ථාපනය කළ යුතු යයි මෙම ප්‍රතිපත්ති සන්නිවේශනයෙන් යෝජනා කැරෙයි.** එසේ යෝජනා කැරෙන්නේ සමාජ විද්‍යා ක්ෂේත්‍රය තුළින් මතු වෙමින් පවත්නා මානව යහජීවනය හා අන්තර්ක්‍රියාකාරී පාලනය යන නව සංකල්පයන් දෙක මත පිහිටා ය.

## 1. ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර මුහුදු සීමාවන්

1982 මුහුදු නීතිය පිළිබඳ එක්සත් ජාතීන් ගේ ප්‍රඥප්තිය (UNCLOS) ක්‍රියාත්මක වීමට බොහෝ කලකට පෙර පෝක් සමුද්‍ර සන්ධිය ඔස්සේ වූ මුහුදු සීමාව නිගමනය වූයේ සමාන දුර පදනම් කරගෙන ය. මේ ආකාරයෙන් ධීවර කලාපයන් බෙදා සලකුණු කරනු ලැබ තුබුණු ජාත්‍යන්තර මුහුදු සීමා රේඛාවට (IMBL) ඇතැම් අවස්ථාවන් හි දී දෙරටෙහි ම සිට තුබුණේ කිලෝ මීටර 16 ක් තරම් වූ දුරක් පමණි.




Map No. 4172 Rev. 2 UNITED NATIONS
January 2007

කච්චතිවු දූපතේ අයිතිය ද ශ්‍රී ලංකාවට ලැබුණේ මේ ගිවිසුමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ය. 1976 ගිවිසුමෙන් බෙංගාල බොක්කෙහි හා මන්නාරම් බොක්කෙහි මුහුදු සීමාවන් පිළිබඳ තීරණයට එළඹෙන ලදී. මෙම මුහුදු ප්‍රදේශ තුළ ධීවර කර්මාන්තයේ යෙදුණු පාරම්පරික ධීවරයනට ඒවායෙහි තුබුණු ධීවර සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ දී එකී සීමාවන් බාධාවක් නො වී ය. එකී මුහුදු ප්‍රදේශ බොහෝ විට හඳුන්වනු ලැබුවේ ''පැරැණි මුහුදු'' ලෙසට ය. අවුරුදු 30 ක් තිස්සේ පැවැති සිවිල් යුද්ධය සමයේ ධීවර කටයුතු හා සම්බන්ධ නොයෙතුත් සීමාවන් ශ්‍රී ලංකාවට අවාසිකර ආකාරයෙන් පැනැවුණු අතර ජාත්‍යන්තර මුහුදු සීමාවෙන් ශ්‍රී ලංකාව සතු කොටසට බලෙන් ඇතුළු වීමේ අවස්ථාව ද ඉන්දියානු ධීවරයනට ලැබුණේ ය. මෙසේ පැමිණි බොහෝ දෙනෙකු ශ්‍රී ලංකා නාවුක හමුදාව විසින් ආරක්ෂක හේතූන් මත අත්අඩංගුට ගැනුණු අතර එයින් ඇතැම්හු සිරගත කරනු ලැබූහ. දැන් යුද්ධය අවසාන ය. උතුරේ ධීවර ජනතාව සිය කර්මාන්තය යළිත් අරඹා තිබේ. එහෙත් ඔවුහු දැන් විශාල වශයෙන් අප ගේ මුහුදු සීමාවට අනවසරයෙන් ඇතුළු වන ඉන්දීය ධීවරයන්, විශේෂයෙන් ම යෝධ දැල් කරුවන් වෙතින් එල්ල වන තරගය හේතු කොටගෙන ඇති වන හිරිහැරයට මුහුණ දෙති. දෙපාර්ශ්වය අතර එදිරිවාදුකම් දැන් උග්‍ර වෙමින් තිබේ. සෑම පාර්ශ්වයකට ම පිළිගත හැකි වන්නා වූ විසඳුමකට එළැඹීමේ අවශ්‍යතාව මිත්‍ර දෙරටක් වූ ඉන්දියාවට මෙන් ම ශ්‍රී ලංකාවට ද තිබේ.

## 2. පැරැණි මුහුදු

සැතපුම් 70 ක් පමණ දික් වූ පෝක් කලාපය, උතුරෙන් හා බටහිරින් ඉන්දියානු අර්ධද්වීපයේ වෙරළ තීරයට ද දකුණින් පැම්බියන් සමුද්‍ර සන්ධියට මෙන් ම රාමේෂ්වරම් හා රාමසේතු (ආදම් ගේ පාලම යනුවෙන් ප්‍රසිද්ධ කොරල් දූපත්) යන දූපත්වලට ද මායිම් වී පිහිටා තිබේ. නැගෙනහිරින් එය මායිම් වන්නේ ශ්‍රී ලංකාවට ය. එහි ඊශාන දිගින් බෙංගාල බොක්ක දෙසට විවෘත වුණු සැතැපුම් 32 ක් පමණ පළල මුහුදු තීරුවකි. පෝක් සමුද්‍ර සන්ධිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ මෙම මුහුදු කලාපයේ බෙංගාල බොක්ක දෙසට හැරී පිහිටි උතුරු කොටසයි. ධීවර කර්මාන්තය සඳහාත් භාණ්ඩ හා මගී ප්‍රවාහන කටයුතු සඳහාත් මෙම කලාපය පරිහරණය කරනු ලබන්නේ ඉන්දියාව හා ශ්‍රී ලංකාව විසින් පමණකි. අන්තර්ක්‍රියාකාරිත්වය තුළින් ප්‍රතිලාභ ලැබීමේ අවස්ථාව ඈත අතීතයේ පටන් ම ශ්‍රී ලංකාව සහ ඉන්දියාව යන දෙරටෙහි ජනතාව වෙත පෝක් මුහුදු කලාපය විසින් උදා කර දෙනු ලැබී ය. අනාදිමත් කාලයක සිට මෙම දෙරටෙහි දස දහස් ගණන් ධීවර ජනතාව සිය ජීවිකාව සරි කර ගත්තේ පෝක් මුහුදු කලාපයේ පිහිටෙනි.

ආරම්භයේ දී ශ්‍රී ලංකා ධීවරයන් සතුව මෙන් ම ඉන්දීය ධීවරයන් සතුව ද කට්ටමරම් ඔරු මිස යාන්ත්‍රික යාත්‍රා නොතිබිණ. නයිලෝන් කෙඳි යොදා සකස් කරගැනුණු පාරම්පරික දැල් ඔවුහු භාවිත කළහ. ජල උල්පත් රහිත මිනිස් වාසයකින් ද තොර කච්චතිව් දූපත මත්ස්‍ය කර්මාන්තය හා අදාළව විශේෂ වැදගත්කමකින් යුතු වූයේ ය. යාන්ත්‍රික යාත්‍රා නො තුබුණු සමයේ දී එක් දිනක් තුළ ආවරණය කළ නො හැකි වූ මත්ස්‍ය බිම්වල ප්‍රයෝජනය ලබාගැනීම පිණිස එය ධීවරයනට අතිශයින් ප්‍රයෝජනවත් විය. මත්ස්‍යයන් බහුල කාලවල දී ඔවුහු එම දූපතෙහි කූඩාරම් සකසාගෙන මසුන් අල්ලමින් සතියක පමණ කාලයක් රැඳී සිටියහ. මන්නාරමෙන් යන ධීවරයෝ ද කච්චතිව් දූපතෙහි රැඳී හිඳිමින් සිය වෘත්තියෙහි නියැලුණහ. දෙරටෙහි ධීවරයන් එකල සිය කර්මාන්තයෙහි යෙදුණේ ඉහළ මට්ටමේ අවබෝධයකින් යුතුව ය. එහි පිහිටි ශාන්ත අන්තෝනි දේවස්ථානය නිසා වාර්ෂික වන්දනා කරුවන් ගේ ද ගෞරවයට එම දූපත පාත්‍ර වී ය. දේවස්ථානය යාපනයේ බිෂොප් තුමා යටතේ පාලනය වූවකි. පෝක් කලාපය දෙපස ම සිටි ධීවර ජනතාව දහස් ගණනින් මෙම දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය සඳහා පැමිණියහ. දෙරටෙහි ම ධීවරයන් මසුන් ඇල්ලීමෙහි යෙදුණේ එක ම මුහුදු කලාපයේ වුව ද එකිනෙකට වෙනස් ක්‍රම ඔස්සේ සිය කර්මාන්තයේ යෙදුණු ඔවුන් උනන්දුව දැක්වූයේ ද එකිනෙකින් වෙනස් මත්ස්‍ය ප්‍රභේද විෂයෙහි ය. එකල ඔවුන් අතර ගැටුම් ඇති නො වූයේ එබැවිනි.

## 3. යුද්ධයෙන් පසු ඇති වූ වර්ධනයන්

මෙම කලාපය තුළ යුද්ධයෙන් පසු තුන් ආකාරයක වර්ධනයන් සිදු වී ඇති බව සඳහන් කළ හැකි ය. ඉස්සන් සඳහා ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවත්නා ජාත්‍යන්තර ඉල්ලුම හා තමිල්නාඩු ධීවරයන් විසින් ඉස්සන් ඇල්ලීම සඳහා කැරන මහ පරිමාණ ආයෝජනයන් (“pink gold rush”) ඉන් පළමුවැන්නයි. දෙවැන්න වන්නේ විශේෂයෙන් ම ට්‍රෝලර් යාත්‍රා ඇතුළු යාන්ත්‍රික ධීවර යාත්‍රාවන් නිෂ්පාදනයෙහි ලා විශාල ලෙස මුදල ආයෝජනය කරමින් ඉන්දියාව පැත්තෙන් නැවතත් යාන්ත්‍රික යාත්‍රාවන් හඳුන්වා දෙනු ලැබීමයි.උතුරු හා නැගෙනහිර මුහුදු තීරයන් හි ධීවර කර්මාන්තය සඳහා දැඩි සීමා කිරීම් පනවන්නට හේතු මතු කළ යුද්ධයක් 1983 මුල් භාගයේ දී ශ්‍රී ලංකාව තුළ ඇති වීම තුන් වැන්නයි.

නාගපට්නම්, තන්ජාවූර්, පුදුක්කෝට්ටායි, රාම්නාතපුරම් ආදී වූ තමිල්නාඩුවෙහි මුහුදුබඩ දිස්ත්‍රික්කයන් හි ධීවර යාත්‍රා සිය

මුහුදු සීමාවන් තුළ ඉස්සන් ඇල්ලීමට මුලින් පටන් ගත් අතර මුහුදු යාමට අදාළ සීමාවන් උතුරු ශ්‍රී ලංකාවෙහි පැනවෙන විට ජාත්‍යන්තර මුහුදු සීමාවන් අබිබවා යමින් ශ්‍රී ලංකාවට අයත් ප්‍රදේශයට ඇතුළු වන්නට ද පටන් ගත්හ. එල්ටීටී මුහුදු කොටි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පෝක් කලාපය තුළ අවදියෙන් සිටි ශ්‍රී ලංකා නාවුක හමුදාව විසින් ශ්‍රී ලංකාවට අයත් ප්‍රදේශය තුළ මසුන් ඇල්ලීමෙහි නිරත වූ ඉන්දීය ධීවරයෝ විශාල සංඛ්‍යාවක් අත් අඩංගුවට ගනු ලැබූහ. මෙවැනි අත් අඩංගුවට ගැනීම් බොහොමයක් සිදු කරන ලද්දේ මුහුදු සීමා උල්ලංඝනය කිරීම යටතේ නොව ''ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත'' යටතේ ය.

ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ධීවරයන් කියන ආකාරයට ජාත්‍යන්තර මුහුදු සීමාව අබිබවා ඉන්දියානු මුහුදු ප්‍රදේශයට යාමේ අවශ්‍යතාවක් ඔවුනට නැත. දකුණු ඉන්දීය යාත්‍රාවන් පැමිණ මත්ස්‍ය සම්පත මුළුමනින් ම මෙන් ලබාගැනීම හේතු කොටගෙන එම කොටස ධීවර සම්පත් හීන ප්‍රදේශයක් බවට පත් වී ඇති බැවිනි. මුහුදු සීමාව ඉක්මවා ඉන්දීය මුහුදට පිවිසීම නිසා ඉන්දියාව විසින් අත් අඩංගුවට ගැනෙන්නේ ශ්‍රී ලංකාවේ දකුණු හා නැගෙනහිර වෙරළ තීරයන් හි ධීවරයන් ය. බොහෝ විට බෙංගාල බොක්කේ දී හෝ අරාබි මුහුදේ දී 1981 ඉන්දියානු මුහුදු කලාප පනත, විදේශ ගමන් බලපත්‍ර පනත, විදේශීයයන් පිළිබඳ පනත යන නීති යටතේ ඔවුහු අත් අඩංගුවට ගැනෙති. මෙය මුළුමනින් ම වෙනස් ගැටලුවක් වශයෙන් සැලකෙන බැවින් මෙම සන්නිවේශනයෙන් ඒ පිළිබඳව සාකච්ඡා කැරෙන්නේ නැත.

දැන් පැහැදිලි වන්නේ මෙම ගැටලුව ''ධීවර යහජීවනය පිළිබඳ අරමුණුත් පාරිසරික සෞඛ්‍යය පිළිබඳ අරමුණුත් අතර පවත්නා ගැටුම සඳහා විසඳුම් සෙවීමේ'' අවශ්‍යතාවක තත්ත්වයට පත්වී ඇති බවයි.

## 4. ගැටලුව විසඳීම සඳහා වූ රජයේ වැඩ පිළිවෙළ

තමිල්නාඩු ධීවරයන් හා ඔවුන් ගේ දේශපාලන නායකයන් විසින් මතු කරන ලද නො සන්සුන්තාවන්ට ප්‍රතිචාරාත්මකව ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නිලධරයන් නවදිල්ලියේ දී හමු වී කරන ලද සාකච්ඡාවන් ගෙන් අනතුරුව ඒකාබද්ධ ක්‍රියාකාරී මණ්ඩලයක් පිහිටුවීමේ තීරණයකට එළැඹිණි. 2005 අප්‍රේල් 21 වැනිදා එම මණ්ඩලයේ පළමුවැනි රැස්වීම නව දිල්ලියේ දී පවත්වන ලදී. ඉන්දීය කෘෂිකර්ම අමාත්‍යාංශය, සත්වපාලන සහ කිරි නිෂ්පාදන කටයුතු දෙපාර්තමේන්තුව යන ආයතනත් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයත් අතර වූ අවබෝධතා ගිවිසුමක කෙටුම්පතක් ද ඉන්දීය බලධාරීන් විසින් සකස් කොට 2005 දී (2005. 04. 21) ශ්‍රී ලංකාව වෙත එවනු ලැබී ය. ශ්‍රී ලංකා බලධරයන් ගේ සංශෝධනයන්ට භාජන වූ මෙම අවබෝධතා ගිවිසුම් කෙටුම්පත ඉන්දීය බලධරයෝ යළිත් සංශෝධනයන්ට භාජන කළහ.(2008. 10. 25)

මුහුදු සීමාව පිළිබඳව දෙරටෙහි සහභාගිත්වයෙන් යෙදෙන දැඩි මුරකාවල් ද මුදාහරිනු ලබන යාත්‍රාවන් ආපසු රැගෙන ඒමේ කටයුතු සඳහා ආයතනික සහායයන් ලබා දීම ද අත් අඩංගුවට ගනු ලැබූ ධීවරයන් හා ඔවුන් ගේ යාත්‍රාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රමවේදයන් ද ධීවරයනට එරෙහි බලාත්කාරකම් වැළැක්වීමේ පියවරයන් ද යාත්‍රාවන් ප්‍රමාදයකින් තොරව මුදාහැරීම පහසු කැරැවෙන පහසු හා සරල ක්‍රමවේදයන් ද යනාදී විෂයයන් මුහුදු සීමා උල්ලංඝනය කිරීම් හා අත්අඩංගුවට ගැනීම් යටතේ මෙම ලේඛනයෙහි අන්තර්ගත වී තිබිණි. එසේ වුව ද මෙම අවබෝධතා ගිවිසුම හා සම්බන්ධව කිසිදු පියවරක් මෙතෙක් ඉදිරියට තබා නැත.

**1 වැනි චතුරශ්‍රය**

''ජාත්‍යන්තර මුහුදු සීමා රේඛාව සහේතුකව අතික්‍රමණය කරන ධීවරයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය හා සම්බන්ධ විධිවිධානයන් යෙදීමේ අරමුණ ඇතිව 2008 ඔක්තෝබරයේ දී ප්‍රකාශයට පත් ඒකාබද්ධ වැඩ පිළිවෙළ හේතු කොටගෙන අසතුටුදායක සිද්ධීන් අවම වී තිබීම පිළිබඳව ඉන්දියානු අග්‍රාමාත්‍ය වරයාත් ශ්‍රී ලංකා ජනාධිපත්වරයාත් සිය සතුට පළ කළහ. ධීවරයන් ගේ ප්‍රවේසම සහ සුරක්ෂිතතාව තව දුරටත් ශක්තිමත් කළ හැකි ක්‍රම සොයා බැලීමට එකඟ වූ මෙම දෙපාර්ශ්වය විසින් ධීවර කටයුතු හා සම්බන්ධ ඒකාබද්ධ ක්‍රියාකාරී මණ්ඩලයේ කටයුතු යළි පණ ගැන්වීමට පියවර ගන්නා මෙන් ස්වකීය රටවල නිලධරයනට උපදෙස් දෙන ලදී. දෙරටෙහි ධීවර සංගම් අතර වූ සම්බන්ධතාවන් වැඩි දියුණු කොට ශක්තිමත් කරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ද තීරණය කරන ලදී.''

(2010 ජූනි 8 වැනිදා සහ 11 වැනිදා අතර දිනවල දී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ඉන්දියාවෙහි කළ නිල රාජ්‍ය සංචාරයේ දී ඉන්දියාව හා ශ්‍රී ලංකාව විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශයෙහි 31 වැනි වගන්තිය)

2010 ජූනි 8 වැනිදා සහ 11 වැනිදා අතර දිනවල දී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ඉන්දියාවෙහි කළ නිල රාජ්‍ය සංචාරයේ දී ඉන්දියාව හා ශ්‍රී ලංකාව විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශයෙහි දී ද ඉහත දැක්වුණු ආකාරයේ ඒකාබද්ධ ක්‍රියාකාරී මණ්ඩලයක අවශ්‍යතාව අවධාරණය කරනු ලැබිණ. (1 වැනි චතුරශ්‍රය බලන්න)

## 5. ධීවර කතිකාව

ඉන්දීය හා ශ්‍රී ලාංකීය ධීවරයන් අතර ඇති වූ ඵලදායී කතිකාවක දී පැහැදිලිව මතු කොට දැක්වුණු අවස්ථාවන් දෙකක් මෙහි ලා සඳහන් කළ හැකි ය. (අ) 2004 මැයි මස කොළඹ දී සහ මන්නාරමෙහි දී පැවැති මිත්‍රත්ව දූත වැඩසටහන සහ (ආ) 2010 හි චෙන්නායි සාකච්ඡා යනු එකී අවස්ථා දෙකයි. මෙම අවස්ථාවන් දෙකෙහි දී ම ජාත්‍යන්තර මුහුදු සීමාවන් සහ අනවසරයෙන් ඇතුළු වීම් යන විෂයයන් සාකච්ඡාවට භාජන වී ය.

### අ) 2004 මිත්‍රත්ව දූත වැඩ සටහන

පෝක් කලාපයේ ධීවර අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඇති වන ගැටුම් පිළිබඳව ශ්‍රී ලංකා ධීවරයන් සමඟ සාකච්ඡා කිරීම පිණිස තමිල්නාඩු ධීවර කණ්ඩායමකගෙන් සමන්විත මිත්‍රත්ව දූත පිරිසක් 2004 මැයි මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණියහ. මෙම

දූත ව්‍යාපාරය සංවිධානය කරනු ලැබ තුබුණේ අත් අඩංගුවට ගැනුණු ධීවරයන් වෙත හා ඔවුන් ගේ පවුල් වෙත සහාය සැලසීමෙහි නිරත රාජ්‍ය නොවන සංවිධානයක් වූ නිර්දෝෂී ධීවරයන් මුදාගැනීමේ සංගමය (ARIF) විසිනි. යෝධ දැල් වර්ග හතරක් භාවිත කිරීමෙන් වැළකී සිටීමටත් පෝක් කලාපීය වෙරළ තීරයේ සිට සැතැපුම් 3 ක් හා උතුරු වෙරළෙහි (යාපන - වදමරච්චි තීරය) සිට සැතැපුම් 7 ක් දක්වා වූ ප්‍රදේශය වෙත නො එළඹීමටත් අතුරු ක්‍රියා මාර්ගයක් වශයෙන් ඉන්දීය දැල් කරුවෝ මෙහි දී එකඟ වූහ. මෙකී එකඟතාව කෙතෙක් දුරට අනුගමනය කරන ලද්දේ දැ'යි නොදනිමු.

### ආ) 2010 හි චෙන්නායි සාකච්ඡා

2010 අගෝස්තු 16 සිට 22 අතරතුර දිනවල දී ශ්‍රී ලංකා ධීවර නියෝජිත කණ්ඩායමක් රාජ්‍ය නොවන සංවිධානයන් හි නියෝජිතයන් ද ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු ද කැටුව තමිල්නාඩු ධීවර ගම්මාන ගණනාවක් වෙත ගොස් ධීවර කණ්ඩායම් කීපයක් සමඟ සාකච්ඡා කළහ. දෙරටෙහි ම ධීවරයනට පිළිගත හැකි විසඳුමක් සොයාගැනීමෙහි අරමුණ ඇතිව ක්‍රියාත්මක කරන ලද මෙම වැඩ සටහනෙහි දී සාකච්ඡා වට හා වැඩමුළු ගණනාවක් ම පවත්වන ලදී.

ශ්‍රී ලංකා මුහුදෙහි යාන්ත්‍රික දැල් භාවිතයෙන් වැළකීමට හා ශ්‍රී ලාංකික ධීවරයන ගේ ජීවිකාව කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරවන කිසිදු කාර්යයක නො යෙදීමට ඉන්දීය ධීවරයන් එකඟ වීම මෙම සාකච්ඡාවන් හි එක් ප්‍රතිඵලයකි. ශ්‍රී ලංකා මුහුදෙහි යාන්ත්‍රික දැල් දැමීම නවතාලීම පියවර කීපයකින් ක්‍රියාත්මක කිරීමට මෙහි දී එකඟතා ඇති කරගන්නා ලදී. මේ අනුව එක් අවුරුද්දක් ගත වන තෙක් දින 70 ක් පමණක් එකී දැල් දැමීමේ කාර්යයෙහි නිරත වීමට අවසර ලබා දුන් අතර, ඉන් අනතුරුව ශ්‍රී ලංකා මුහුදු සීමාවෙහි දැල් දැමීම ඉන්දීය ධීවරයන් විසින් මුළුමනින් නතර කළ යුතු වන්නේ ය. අනවසර-යෙන් ඇතුළු වීම් සහ අත් අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් සොයාබැලීම සඳහා ඒකාබද්ධ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවීම ධීවරයන් ගේ පැත්තෙන් ඉදිරිපත් වූ තවත් වැදගත් යෝජනා-වකි. ( 2 වැනි චතුරශ්‍රය බලන්න)

**2 වැනි චතුරශ්‍රය**

''ධීවර කර්මාන්තයේ යෙදීම හා අදාළ සෑම තත්ත්වයක් ම (ඉන්දීය ධීවරයන් විසින්) නිරීක්ෂණය කරනු ලැබිය යුත්තේ දෙරටෙහි ම ආණ්ඩුවල සහභාගිත්වය ඇතිව ය. ධීවර කටයුතු භාර නිලධරයන් ද ධීවර ජනතාව ද දෙරටෙහි ම නාවුක/වෙරළාරක්ෂක අංශ ද නියෝජනය වන ආකාරයෙන් අදාළ නිරීක්ෂක කමිටුව සකස්ව තිබිය යුතු ය.''

(ඉන්දීය සහ ශ්‍රී ලාංකීය ධීවර කණ්ඩායම් විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශය - චෙන්නායි රැස්වීම - 2010 අගෝස්තු 16-22)

අතීතයේ දී පැවැති ධීවර කතිකාවන් තුළින් වැදගත් කරුණු තුනක් අනාවරණය වෙයි. පළමුවැන්න වන්නේ යෝධ දැල් එලීම මත්ස්‍ය සම්පත් විෂයෙහි හානිකර බැවින් එය නැවැත්විය යුතු බව දෙරට ම විසින් පිළිගනු ලැබීමයි. ශ්‍රී ලංකාවට අයත් මුහුදු ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වීම නවතා දැමිය යුතු බව ඉන්දීය ධීවරයන් විසින් පිළිගනු ලැබීම දෙවැන්නයි. තෙවැන්න නම් පෝක් මුහුදු කලාපයේ මසුන් ඇල්ලීමේ කටයුතු ඒකාබද්ධ නිරීක්ෂණ කණ්ඩායමක් යොදාගනමි න් හෝ දෙරටෙහි ම නිරීක්ෂණය යටතේ හෝ සිදු විය යුතු බවයි.

### 6. අත් අඩංගුවට ගැනීම් පිළිබඳ ප්‍රශ්නය

ඉන්දියන් සාගරය තුළ දී අනවසරයෙන් ඇතුළු වීමේ වරදට අත් අඩංවට ගැනෙන ධීවරයෝ කොටස් දෙකකට අයත් වෙති. ශ්‍රී ලංකාවේ දකුණු හා බටහිර පළාත්වල සිට බහුදින යාත්‍රාවන් මඟින් ඉන්දියන් සාගරයේ (අරාබි මුහුද, බෙංගාල බොක්ක, මන්නාරම් බොක්ක, අන්දමන් දූපත්, ලක්ස්වදීප් දූපත් ආදී කොටස්වල) මසුන් ඇල්ලීම කරන පිරිස එක කොටසකි. අනෙක් කොටස නම් පෝක් මුහුදු කලාපයේ ශ්‍රී ලංකාවට අයත් කොට-සෙහි මසුන් ඇල්ලීම පිණිස ජාත්‍යන්තර මුහුදු සීමා රේඛාව අතික්‍රමණය කරන තමිල්නාඩු ධීවරයන් ය. කලින් සඳහන් වුණු පිරිස ඉන්දියානු බලධරයන් විසින් අත් අඩංගවට ගැනෙන අතර දෙවැනි පිරිස අත් අඩංගුවට ගැනෙන්නේ ශ්‍රී ලංකා බලධරයන් විසිනි. පොක් මුහුදු කලාපය හා අදාළ ධීවර ප්‍රශ්න සාකච්ඡා කිරීමේ අරමුණ ඇතිව සකස් කැරෙන මෙම ප්‍රතපි ත්ති සන්නි-වේශනයේ දී ප්‍රථමයෙන් සඳහන් වුණු කොටස පිළිබඳව අවධානය යොමු කරනු නො ලැබේ.

1982 මුහුදු නීතියෙහි (UNCLOS) 73 සහ 73 (2) වගන්තීන් හි අත්අඩංගුවට ගනු ලබන යාත්‍රාවන් සහ ඒවායෙහි නිරත පුදුගලයන් සාධාරණ බැඳුම්කරයක් හෝ වෙනත් සුරැකුමක් ලබාගැනීමෙන් අනතුරුව මුදා හරිනු ලැබිය යුතු බව හා අනන්‍ය ආර්ථික කලාපමය (EEZ) ධීවර නීති රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දඬුවම් වශයෙන් සිරගත කිරීම් හෝ ශාරීරික හිංසා පැමැණවීම් හෝ කළ නොහැකි බව සඳහන් වුව ද ඒ පිළිබඳ අවධානය යොමු කිරීමක් ඉන්දියාව පැත්තෙන් හෝ ශ්‍රී ලංකාව පැත්තෙන් හෝ සිදු වී නැත. ධිවරයන් අත්අඩංගුවට ගනු ලැබ ඇත්තේ වෙනත් නීති යටතේ විනා අනවසරයෙන් ඇතුළු වීම යටතේ නොවේ.

ශ්‍රී ලාංකීය ධීවරයන් ඉන්දීය බලධාරීන් විසින් අත් අඩංගුවට ගනු ලබන්නේ ඉන්දීය සාගර කලාප පනත (MZI), විදේශ ගමන් බලපත්‍ර පනත හෝ විදේශීයයන් පිළිබඳ පනත ආදී නීති උල්ලංඝනය කිරීම මත ය. (බහුතරය ඉන්දීය සාගර කලාප පනත මත ය.) ප්‍රාන්තීය ආණ්ඩුව විසින් සිදු කැරෙන ප්‍රාථමික පරීක්ෂණයන් හි වාර්තාවන් මධ්‍යම රජයේ තීරණය ලබාගැනීම පිණිස නව දිල්ලිය වෙත යොමු කරනු ලැබේ. මෙම සමස්ත ක්‍රියාවලියට එක් අවුරුද්දක පමණ කාලයක් වැය වේ.හිරිහැරයට පත් වන්නේ අත් අඩංගුවට පත් ධීවරයන් සහ ඔවුන් ගේ පවුල් ය. යාත්‍රාවන් හි අයිතිකරුවෝ කිසිදු වගකීමකින් නො බැඳෙති. ධීවර ක්ෂේත්‍රයෙහි නිරත වීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) හා අදාළ කිසිදු නීතියකට ඔවුන් යටත් නො වන බැවිනි. පොක් මුහුදු

කලාපය හරහා එන ඉන්දියානු ධීවරයන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත් අඩංගුවට ගැනෙන්නේ බොහෝ විට ආරක්ෂාව පිළිබඳ හේතු පදනම් කරගෙන ය. එනම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ය. එසේ අත් අඩංගුවට ගැනෙන්නවුන් අනුරාධපුර අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ ඔවුනට එරෙහිව ඇති චෝදනා විනිශ්චය කොට දඬුවම් පමුණුවන තෙක් රඳවාගැනීම පිණිස දිවයිනේ විවිධ පළාත්වල පිහිටි බන්ධනාගාර වෙත යවනු ලබති. මෙම ක්‍රියාවලිය සඳහා මාස 3 සිට 12 දක්වා කාලයක් ගත වන්නේ ය. මෙසේ ඔවුන් දිගු කාලයක් රඳවා තබාගැනීමට සිදු වීම කෙරෙහි බල පාන්නේ ඔවුන් ගේ අනන්‍යතාවන් තහවුරු කරගැනීමෙහි දී (එනම් ඔවුන් සැබැවින් ම ධීවරයන් ද යන බව නිගමනය කිරීම සඳහා) ඇති වන ප්‍රමාදයයි. මෙම ගැටලුවට යම් විසඳුමක් වශයෙන් ඔවුන් ගේ අනන්‍යතාව තහවුරු කැරෙන කිසියම් ලිඛිත සාක්ෂියක් ඉන්දියන් සාගරයෙහි ධීවර කර්මාන්තයේ යෙදෙන්නන් වෙත ලබා දීම විෂයෙහි දෙරටෙහි ම ආණ්ඩු සිතා බැලිය යුතු ය.

කෙසේ වුව ද මෑතක දී ක්‍රියාත්මක කැරුණු වැඩ පිළිවෙළක් යටතේ තමන් විසින් රඳවාගනු ලැබ සිටින ශ්‍රී ලාංකීය ධීවරයන් තමිල්නාඩු ධීවර ඇමැතිවරයා ගේ අනුමැතියට යටත්ව මුදා හැරීමට තමිල්නාඩු රජය තීරණය කරන්නේ ය. ඇමැතිවරයා විසින් මෙකී අනුමැතිය දෙනු ලබන්නේ දිස්ත්‍රික් ප්‍රධානයා (District Collector) වෙතින් ලබාගැනෙන විමර්ශනාත්මක වාර්තාවක් මත පිහිටා ය. මෙහි දී තමිල්නාඩු ප්‍රාන්තීය රජය අදාළ කරුණ ඉන්දීය රජය වෙත යොමු කිරීමට කිසිසේත් කටයුතු නො කරන බැවින් නිසැකව ම ප්‍රමාදයන් අවම වන්නේ ය. මේ වනාහි ශ්‍රී ලංකාව ද ප්‍රමාදයන් අවම කිරීමේ ක්‍රම වේදයක් ලෙස අනුගමනය කළ යුතු පිළිවෙතකි. ශ්‍රී ලංකාවෙහි දැනට ක්‍රියාත්මක වන ආකාරයට පොලිසිය, ආගමන විගමන දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව වැනි විවිධ රාජ්‍ය ආයතන මෙයට සම්බන්ධ කරගැනීමකින් තොරව ධීවරයන් අත් අඩංගුවට ගැනීම් හා අදාළ ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා එක් බලය ලත් ආයතනයක් ස්ථාපනය කරවීම කෙරෙහි රජයේ අවධානය යොමු වන්නේ නම් යොග්‍ය ය.

අත් අඩංගුවේ සිටිය දී ධීවරයන් විවිධ අතවරයනට භාජන වන බවට ද පැමිණිලි තිබේ. එයට අමතරව ධීවරයනට මෙන් ම ඔවුන් ගේ පවුල්වලට ද අතිශය දුෂ්කරතාවනට මුහුණ දීමට මෙවැනි තත්ත්වයන් නිසා සිදු වන්නේ ය. හිරිහැරයට පත් ධීවරයන් ගේ පවුල් සඳහා රැකවරණ සැපයීමෙහි යෙදෙන ආයතනයක් නැත. ඔවුන් ගේ ජීවිත කෙරෙහි ද මෙතුළින් තර්ජනයක් එල්ල වනවා පමණක් නොව ස්වකීයයා මුදාගැනීම පිණිස එක් එක් පුද්ගලයන් පසුපස යාමට ද ඔවුනට සිදු වන්නේ ය.

## 7. ප්‍රතිපත්තිමය දුබලතා

දෙරටෙහි ම ආණ්ඩු ප්‍රයත්න දරන්නේ මුහුදු සීමාවනට දැඩි සේ අනුකූලව කටයුතු කිරීමට ය. සිය ශක්තිමත් නිරීක්ෂණ ක්‍රියාමාර්ගයන් ද මනා මුරකාවල් ද හේතු කොටගෙන ඉන්දීය සාගර කලාප පනත මැනවින් ක්‍රියාවට නැංවීමේ හැකියාව ඉන්දීය වෙරළාරක්ෂකයනට ලැබී තිබේ. එල්ටීටීය සහ එහි මුහුදු කොටි බලවේගය සමඟ සටන් කිරීම පිණිස වැඩි අවධානයක් යොමු කරන්නට සිදුවීම නිසා මුහුදු සීමාවන් උල්ලංඝනය කිරීම් පිළිබඳ නිසි අවධානය යොමු කිරීමට ශ්‍රී ලංකා නාවික හමුදාවට නො පුළුවන් වූයේ ය. ඔවුන් ගේ අවධානය යොමු වූයේ ශ්‍රී ලංකාවට අයත් මුහුදේ සැරිසරන නීති විරෝධී යාත්‍රාවන් විෂයෙහි ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඉන්දීය ධීවරයන් ද අත් අඩංගුවට ගැනුණේ බොහෝ දුරට එවැනි තත්ත්වයක් යටතේ ය. ස්වකීය අනන්‍යතාව තහවුරු කිරීමෙන් අනතුරුව එබඳු ධීවරයන් මුදා හැරුණා විනා බොහෝ අවස්ථාවන් හි දී ඔවුනට එරෙහිව නීතිමය පියවර ගැනීමට ශ්‍රී ලංකා නාවුක හමුදාව කටයුතු නො කළ බව ද මෙහි ලා සඳහන් කළ යුතු ය. එසේ වුව ද නාවුක හමුදාව තුළ සැක පහළ වූ අවස්ථාවන් හි දී නම් ඔවුන් ගේ ප්‍රතිචාරය දරුණු වී ය. ඇතැම් ඉන්දීය ධීවරයන් මරා දැමුණු බවට ද පැමිණිලි තිබේ. ( 3 වැනි චතුරශ්‍රය බලන්න)

> **3 වැනි චතුරශ්‍රය**
>
> 1983 සිට 2001 දක්වා කාලය අතරතුර දී ශ්‍රී ලංකා නාවුක හමුදාවේ වෙඩි තැබීම් හේතු කොටගෙන ඉන්දීය ධීවරයන් 105 ක් මිය ගොස් තිබේ. ධීවරයන් 286 දෙනෙක් තුවාල ලබා ඇති අතර සිය ගණනක් අත් අඩංගුවට ගනු ලැබ තිබේ. 1997 ජනවාරි මාසයේ සිට වෙඩිතැබීම් ප්‍රමාණය පහත වැටුණු නමුදු ගැටලුව තවමත් පවතින්නේ පාලනය කළ නොහැකි තත්ත්වයක ය......... පෝක් මුහුදු කලාපයේ හටගන්නා සිද්ධීන් නිසා වඩාත් ම හිරිහැරයට පත්ව ඇත්තේ රාමේශ්වරම්-මණ්ඩපම් ප්‍රදේශයයි.ඇතැම් අවස්ථාවන් හි දී මන්නාරම් බොක්ක කෙරෙහි ද මෙම තත්ත්වය බල පා තිබේ.
>
> (විවේකානන්දන් 200 p)

අත් අඩංගුවට ගැනීම් තුළින් ගැටලුවට විසඳුමක් ලැබී නැත. මසුන් ඇල්ලීම නවතාලිය නොහැකි වීමත් අත් අඩංගුවට ගැනීමට සිදු වන අවස්ථා විරල වීමත් එයට හේතුවයි. අනවසරයෙන් ඇතුළු වීම හා සම්බන්ධව පියවර ගැනීමේ දී මුහුදු නීතියට (UNCLOS) අනුකූල වීමට ආණ්ඩු අසමත් වීම නිසා නිකරුණේ දුක් විඳීමට සිදු වී තිබෙන්නේ ධීවරයනට හා ඔවුන්ගේ පවුල්වලටය. අත්අඩංගුවට ගැනුණු ධීවරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සුළු ක්‍රියා මාර්ගයක් හෝ සැකසීමට ආණ්ඩු මේ වන තෙක් සමත් වී නැත. ධීවරයන් ගේ යහජීවන අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් නොමැති වීම ද බරපතල ගැටලුවකි. මෙම වැඩ පිළිවෙළෙහි දී ධීවරයන් විසින් යම් ප්‍රගතියක් ප්‍රදර්ශනය කරනු ලැබ තුබුණ ද ප්‍රස්තුත ගැටලුව විසඳීම පිණිස කිසියම් වැඩ පිළිවෙළක් සැකසීමෙහි ලා ධීවර ජනතාව ගේ ද අදහස් වෙත සවන් යොමු කිරීමේ වුවමනාවක් ආණ්ඩුවලට තිබෙන බවක් දක්නට නැත. දෙපාර්ශ්වයේ ම ධීවරයෝ තම තමන් ගේ ආණ්ඩුවලට දෝෂාරොපණය කරති.

පෝක් කලාපයේ මුහුදු පතුලේ දැල් එලීම නො කොට ජීවිකාව උපයාගැනීමේ හැකියාවක් තමිල්නාඩු ධීවරයනට නොමැති වීම හේතු කොටගෙන ඇති වන ධීවර අසහනය පැත්තෙන් බලන විට එය එරටට ආර්ථික වශයෙන් අහිතකරව බලපාන්නා වූ ප්‍රශ්නයකි. එසේ ම එය ශ්‍රී ලංකාවට ද ආර්ථික වශයෙන් විශාල හානියක් ඇති කරවන්නේ ය. පාරම්පරිකව මෙන් ම නෛතිකව ද තමන් සතු මුහුදු සීමාවෙහි ඇති ධීවර සම්පත් එම ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වන්නන් විසින් රැගෙන යාම නිසා මුහුදේ ස්වාභාවික සම්පත් ද මෙරටට අහිමි වී යයි. වාර්ෂිකව ඔවුන් විසින් රැගෙන යනු ලබන මුහුදු සම්පත් ප්‍රමාණයේ වටිනාකම රුපියල් මිලියන ගණනකි.

## 8. ප්‍රස්තුත ගැටලුව විසඳීම සඳහා නව ප්‍රතිපත්තිමය නැඹුරුවක් : යහජීවනය හා අන්තර්ක්‍රියාකාරී පාලනය

ඉහත දැක්වුණු සාකච්ඡාවන් විසින් වැදගත් විෂයයන් දෙකක් වෙතට අප අවධානය යොමු කරවනු ලබයි. මානව සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම හා පාරිසරයක තත්ත්වය යහපත්ව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව යනු එකී විෂයයන් වේ. ජීවිකාව උපයාගැනීම පිණිස ජාත්‍යන්තර මුහුදු සීමා රේඛාව අතික්‍රමණය කිරීමට ඉන්දීය ධීවරයන් පෙළැඹීම මෙන් ම ජාත්‍යන්තර මුහුදු සීමා රේඛාවෙන් මෙපිටට පිවිසෙන ඉන්දීය ධීවරයන් වළක්වාලමී ට ශ්‍රී ලාංකික ධීවරයනට ඇති වුවමනාව ද වනාහි මානව අංශයෙන් අතිශය වැදගත්කමක් ගන්නා ගැටලුය. ධීවරයන් අත් අඩංගුවට ගැනීමත් දිගු කාලයක් ඔවුන් රඳවාගෙන සිටීමට සිදු වීමත් මෙන් ම ඔවුනට හා ඔවුන් ගේ පවුල්වලට දිගු කලක් හිරිහැර විඳින්නට සිදු වීමත් යනු එම ගැටලුව තුළින් මතු වන්නා වූ අතිරේක ගැටලු වන්නේ ය. පරිසර පද්ධතිය පැත්තෙන් බැලූ විට එය යහපත්ව තබාගැනීමේ වුවමනාව දෙරටට ම තිබේ. හානිකර නො වන මට්ටමින් සම්පත් පරිහරණය කැරෙන්නේ ද යන්න පිළිබඳව සෑහීමට පත් වනු පිණිස ජාත්‍යන්තර මුහුදු සීමා රේඛාවෙන් තම පැත්තෙහි කැරෙන ක්‍රියාකාරකම් පිළිබඳ සමීප නිරීක්ෂණයන් සඳහා විධිවිධාන යෙදීමට දෙරට ම වග බලාගත යුතු ය. මේ වනාහි යහපත් පාරිසරක තත්ත්වය පිළිබඳ ප්‍රධාන ගැටලුවයි. එහෙත් මෙකී අවශ්‍යතාවන් සපුරාගන්නේ කෙසේ ද? පෝක් මුහුදු කලාපය පිළිබඳ ප්‍රශ්නය මානව සංවර්ධන ඉලක්කයන් සපුරාගැනීම හා පරිසර පද්ධතිය සුරක්ෂිත කරගැනීමේ අවශ්‍යතාව යන විෂයයන් දෙක අතර වූ ගැටුමක තත්ත්වය දක්වා දැන් සංක්ෂේපනය වී ඇති බවක් පෙනෙන්නට තිබේ. යහජීවනය සහ අන්කර්ක්‍රියාකාරී පාලනය යනුවෙන් දැක්වෙන සමාජ විද්‍යා විෂයය තුළ මතු වෙමින් පවත්නා සංකල්පයන් දෙක මෙම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා උපයෝගී කරගැනීම යොග්‍ය බව මෙම ප්‍රතිපත්ති සන්නිවේශනය යෝජනා කරයි. (4 වැනි චතුරශ්‍රය බලන්න)

**4 වැනි චතුරශ්‍රය**

**යහජීවනය සහ අන්තර්ක්‍රියාකාරී පාලනය**

ස්වකීය අවශ්‍යතාවන් සපුරාගනිමින් ද ස්වකීය ඉලක්කයන් කරා සාර්ථක ගමනක යෙදෙමින් ද තෘප්තිමත් ජීවිතයක් ගත කරමින් ද සෙසු අය සමඟ එක්ව වාසය කිරීමේ හැකියාව යනුවෙන් යහජීවනය යන්න නිර්වචනය කරනු ලැබ තිබේ. මෙහි පසුව සඳහන් වුණු අරමුණ සපුරාගැනීමේ අවස්ථාව සැලසෙන්නේ අන්තර්ක්‍රියාකාරී පාලනයක් තුළින් ය. මත්ස්‍ය බිම් තුළ පවත්නා විවිධත්වය හා සංකීර්ණත්වය මෙන් ම විචල්‍යතාවන් ද එහි අවධාරණය වෙයි. ඒවාට විසඳුම් ලබා දිය හැකි වන්නේ ඒ ඒ තත්ත්වයන්ට සංවේදී වන්නා වූ පාලන ක්‍රමයක් තුළින් පමණි. මානව අවශ්‍යතාවන් මෙන් ම පරිසර පද්ධතිය රැකගැනීමේ අවශ්‍යතාව ද සපුරාගනිමින් අදාළ සියලුම පාර්ශ්වයන් ගේ අන්තර්ක්‍රියාකාරීත්වය ඔස්සේ ප්‍රතිපත්ති පිළිබඳ නිගමනයන්ට එළැඹීම අන්තර්ක්‍රියාකාරී පාලන න්‍යායයෙහි අවශ්‍යතාවයි.

- බෙන්වින්ක් ඇතුළු පිරිස (2005); මැක්ග්‍රෙගර් ඇලිස්ටර් (2007)

යහජීවනය යනු කුමක්දැයි වටහාගනු ලැබ ඇති ආකාරය හා එය සාක්ෂාත් කරගැනීම පිණිස අනුගමනය කළ යුතු මාර්ගය පිළිබඳ අවබෝධය අනුව බලන විට මානව වර්ගයා අතර පවතින්නේ එකිනෙකාට වෙනස් වූ අදහස් ය. යහජීවනය පිළිබඳ දෘෂ්ටියක් තුබුණු පමණින් මිනිසුන් ඒ සඳහා විවිධ ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට හේතුව හෝ ඔවුන් ගේ යහජීවනය වැඩිදියුණු කිරීම පිණිස ගත යුතු පියවර හෝ වටහාගැනීමට පුළුවන් වන්නේ නැත.

මෙකී අරමුණ සපුරාගත හැකි වන්නේ 'අන්තර්ක්‍රියාකාරී පාලනය' සඳහා වූ ප්‍රවේශයක් තුළින් ය. මත්ස්‍ය බිම් තුළ පවත්නා විවිධත්වය හා සංකීර්ණත්වය මෙන් ම විචල්‍යතාවන් ද එහි අවධාරණය වෙයි. ඒවා සම්බන්ධයෙන් විසඳුම් සෙවිය හැකි වන්නේ සාමූහික ප්‍රයත්නයන් ඔස්සේ පමණි. පාලන ක්ෂේත්‍රය තුළ විවිධ ක්‍රියාකාරීන් සිටින බව ප්‍රකට කරුණකි. රාජ්‍යය ඒ අතරින් වැදගත් ය. රාජ්‍ය පාලන යාන්ත්‍රණය සහ ධීවර පාලන යාන්ත්‍රණය වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක වීම ඔස්සේ පෝක් කලාපයේ ධීවර ගැටලු සඳහා සාර්ථක විසඳුමක් ලබා දීම නො කළ හැක්කක් වන බව අපට මේ වන විට පෙනී ගොස් තිබේ. පරිසර පද්ධතිය සුරැකීමේ අවශ්‍යතාවන් මෙන් ම මානව අවශ්‍යතාවන් ද සපුරාගත හැකි වන ආකාරයෙන් ප්‍රස්තුත සියලුම පාර්ශ්වයන් ගේ අන්තර්ක්‍රියාකාරීත්වය ඔස්සේ ප්‍රතිපත්ති පිළිබඳ නිගමනයන්ට එළැඹීම අන්තර්ක්‍රියාකාරී පාලන න්‍යායයෙහි අවශ්‍යතාවයි. පෝක් ප්‍රදේශය තුළ අනවසරයෙන් ඇතුළු වීම් නවතාලිය යුතු බවට අතීතයේ දී දෙරටෙහි ධීවරයන් අතර පැවැති සාකච්ඡා

වන් හි දී එකඟතාවන් ඇතිකරගැනීමට හැකි වීම සතුටට කරුණකි. තමිල්නාඩු ධීවරයන් මුහුණ දෙන දුෂ්කරතාවන් කෙරෙහි සැලකිල්ල යොමු කළ ශ්‍රී ලාංකීය ධීවරයෝ ශ්‍රී ලංකාවට අයත් මුහුදු කලාපයෙන් ඉවත් වීම සඳහා එක් අවුරුද්දක කාලයක් තමිල්නාඩු ධීවරයන් වෙත ලබා දීමට එකඟ වූහ. මෙම ගැටලු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වන්නේ ඒකාබද්ධ ක්‍රියාකාරී මණ්ඩලයක් තුළින් බව ධීවරයෝ මෙන් ම ආණ්ඩු ද පිළිගනිති. මෙය පෝක් කලාපයේ ගැටුම් සමථයකට පත් කිරීම සම්බන්ධයෙන් ඇති වුණු වැදගත් වර්ධනයකි. එබැවින් නො පමාව ඒ සඳහා පියවර ගත යුතු වන්නේ ය.

## 9. ඉදිරි ගමන් මඟ

ඉහත මතු කොට දක්වන ලද විවිධාකාර ගැටලු ද රාජ්‍ය හා රජ්‍ය නොවන විවිධ කණ්ඩායම් විසින් යෝජනා කරන ලද හා එකඟත්වයට එළැඹ ඇති විසඳුම් පියවරයන් ද පදනම් කොට ගත් පහත දැක්වෙන නිර්දේශයන් මෙම ප්‍රතිපත්ති සන්නි-වේශනය මඟින් රජය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## ප්‍රතිපත්තිමය නිර්දේශයන්

**අ) නිරීක්ෂණ මුරකාවල් හා පාලන (MSC) ක්‍රියාමාර්ගයන් ඒකාබද්ධව (ඉන්දියාව හා ශ්‍රී ලංකාව) දියත් කිරීම**

**ආ) ඉන්දියන් සාගරය තුළ ක්‍රියාත්මකව සිටින ධීවරයන් වෙත දෙරටෙහි ම ආණ්ඩුව විසින් ඒකාබද්ධව නිකුත් කරනු ලබන අනන්‍යතාව තහවුරු කිරීමේ ලිපි ලේඛන සැපයීම (ඔවුන් නිර්ව්‍යාජ ධීවරයන් වන බව ඒත්තු ගැන්වීම සඳහා)**

**ඇ) ඉන්දියන් සාගරයේ දී අත් අඩංගුවට ගැනෙන නිර්ව්‍යාජ ධීවරයන්ට එරෙහි පියවර ගැනීමේ දී එක්සත් ජාතීන් ගේ මුහුදු නීතිය පිළිබඳ ප්‍රඥප්තියෙහි 73 සහ 73(2) වගන්ති පමණක් අදාළ කරගැනීම**

**ඈ) ප්‍රමාදයන් අවම කළ හැකි වන පරිදි අත් අඩංගුවට ගැනීම් හා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය තනි අධිකාරියකට පැවරීම**

**ඉ) යාත්‍රාවන් හි අයිතිකරුවන් ඒවායෙහි යෙදී සිටින්නවුන් වෙනුවෙන් වග කිව යුතු බවට පත් කරවීම පිණිස ධීවර ක්ෂේත්‍රයෙහි නිරතව සිටීම ආ අදාළව 2007 ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය ද වලංගු කරවීම**

**ඊ) අන්තර්ක්‍රියාකාරී ඒකාබද්ධ කාර්ය මණ්ඩපයක් සහභාගි කරවාගනිමින් ඉහත පියවරයන් ('අ' සිට 'ඉ' දක්වා වූ) ක්‍රියාවට නැංවීම පිණිස සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම**

2008 අවබෝධතා ගිවිසුමෙන් යෝජනා කරනු ලැබ ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන දෙරටෙහි නායකයන් ගේ ඒකාබද්ධ ප්‍රකාශයෙහි ද මතු කොට දක්වනු ලැබ තුබුණු ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම විසින් පෝක් කලාපය තුළ පවත්නා මානව අවශ්‍යතා හා පරිසර පද්ධතිමය අවශ්‍යතා අතර වූ ගැටුම සඳහා පිළියම් යෙදීමෙහි ලා මනා අන්තර්ක්‍රියාකාරී මණ්ඩපයක් නිර්මාණය කරනු ලබන්නේ ය. මෙම පත්‍රිකාවෙන් යෝජනා කරනු ලබන්නේ රාජ්‍ය නිලධරයන් ගෙන් සැදුම් ලත් ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමක් නොව, දෙරටට ම අයත් මෙම ගැටලුවෙහි සියලු ම ප්‍රලම්බිතයන් ද ඒ ඒ අමාත්‍යාංශයන් හි නිලධරයන් ද වෙරළාරක්ෂක නාවුක හා ධීවර සංවිධාන යන සියලු ම අංශයන් ද නියෝජනය වන සේ සැදුම් ලත් අන්තර්ක්‍රියාකාරී ඒකාබද්ධ කාර්ය මණ්ඩපයකි. :ෂනැළජ* ඉහත දක්වන ලද ප්‍රතිපත්තිමය නිර්දේශයන් ද මුහුදු සීමා ගැටලු ද අනවසරයෙන් ඇතුළු වන ධීවරයන් පිළිබඳ ගැටලු ද අත් අඩංගුවට ගැනීම් පිළිබඳ ගැටලු ද පමණක් නොව ගැටුම් සමථයට පත් කරවීම පිළිබඳ ගැටලු ද වෙනුවෙන් ස්වකීය අත්දැකීම් හා දැනුම ද අවශ්‍යතාවන් ද අනුව සිතා බලා අදාළ සියලු ම පාර්ශ්වයන්ට පිළිගත හැකි විසඳුම් රැගෙන ඒමේ අවස්ථාව ගැටලුවෙහි සියලු ම ප්‍රලම්බිතයන් වෙත එමඟින් උදා වනු ඇත. පෝක් කලාපය හා අදාළ ගැටලුවලට අමතරව, ඒ හා කිසිදු සම්බන්ධයක් නැති වුව ද දෙරටෙහි එකඟතාවන් මත විසඳාගත යුතුව පවතින ශ්‍රී ලාංකීය ධීවරයන් ගේ බහුදින යාත්‍රාවන් ඉන්දියානු මුහුදු සීමාවට (අරාබි මුහුද, ලක්ස්වදීප් දූපත්, මන්නාරම් බොක්ක, බෙංගාල බොක්ක, සහ අන්දමන් දූපත්) අනවසරයෙන් ඇතුළු වීම පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් සෙවීම පිණිස ද එම අන්තර්ක්‍රියාකාරී ඒකාබද්ධ කාර්ය මණ්ඩපය ප්‍රයෝජනවත් වන බව නො අනුමාන ය.

## ප්‍රධාන ආශ්‍රිත මූලාශ්‍ර


Amarasinghe O. (2009), Building Governance for Sustainable Small-Scale Fisheries: Bridging Human and Ecosystem Wellbeing. A Policy Brief. "Building Capacity for Sustainable Governance in South Asian Fisheries: Poverty, Wellbeing and Deliberative Policy Networks", NERC-ESRC-DFID Ecosystem Services and Policy Alleviation Programme (ESPA)

Bavinck M, Ratana Chuenpagdee, Mamadou Diallo, Peter van der Heijden, Jan Kooiman, Robin Mahon and Stella Williams, (2005): *Interactive Fisheries Governance- a guide to better practice,* Centre for Maritime Research (MARE), Amsterdam, 72p.

McGregor Allister (2007): Wellbeing, Poverty and Conflict, Briefing Paper 1/08, ESRC Research Group on Wellbeing in Developing Countries, Feb. 2008, University of Bath, UK.

Suryanarayan, V. (2005). *Conflict over fisheries in the Palk Bay region,* Lancer Publishers and Distributirs, New Delhi, India, 207 p.

මෙම ප්‍රතිපත්ති සන්නිවේෂණය රුහුණු සරසවියේ මහාචාර්ය, ආචාර්ය ඔස්කා අමරසිංහ ස්වකිය දිගුකාලීන අත්දැකීම් සහ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සමඟ මෙන්ම ශ්‍රී ලංකාවේ ධීවර කාර්මික සංවිධාන තුළින් ලබාගත් අදහස් පදනම් කරගෙන පාත්ෆයින්ඩර් පදනම වෙනුවෙන් සකසන ලදී.

මෙරට සහ ඉන්දියාවෙහි පළකරනු ලැබූ පොතපත මෙන්ම දෙරටෙහි ධීවර කාර්මික සංවිධාන මගින් ලබාගත් මූලාශ්‍ර මේ සඳහා පදනම් කරගෙන ඇත.

මෙම විෂය සම්බන්ධ වැඩිදුර කරුණු සඳහා **oamarasinghe@yahoo.com** හෝ 0777-074141 මගින් ඔස්කා අමරසිංහ මහතා අමතන්න.

'POLICY BRIEF 25'

**PATHFINDER FOUNDATION** | Telephone No: 2 372 895 | E-mail: info@pathfinderfoundation.org
website: www.sanvada.org, www.pathfinderfoundation.org

Editorial Assistance Ms. Ameera Arooz, Project Manager